# ඇබෑර්තු

# වාරිමාර්ග අමාත්‍යාංශය සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 හා ලෝක බැංකුව අරමුදල් සපයනු ලබන. දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) සඳහා වන රජයේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ප්‍රකාරව පහත සඳහන් තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනමින්" ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (PCU) සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත්, උද්යෝගිමත් හා කැපවී සේවය කළ හැකි ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු සඳහා වන වැටුප් තල වගුව 3හි හා ඉහත සඳහන් MSD චක්‍රලේඛ අංක 01/2019 හි සඳහන්ව ඇත.

- අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩුවිය යුතුය.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය සමග රජයේ රෙගුලාසිවල හුරුපුරුදුභාවය හා පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්වාවශ්‍යතාවයන් වේ.
- විදේශ අරමුදල් යෙදවූ ශ්‍රී ලංකාවේ සිදුකළ ව්‍යාපෘතිවල කාර්ය පළපුරුද්ද හා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකම් වේ.

| අනු අංක | PS වර්ගීකරණය | තනතුර | තනතුරු ගණන | බඳවා ගැනීමේ පදනම | අදාළවන චක්‍රලේඛය |
|---|---|---|---|---|---|
| 01 | PS 3 | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශේෂඥ (අධීක්ෂණය, ඇගැයුම් හා ඉගෙනුම්) | 01 | කොන්ත්‍රාත් | MSD චක්‍රලේඛ අංක 1/2019 |
| 02 | PS 4 | ව්‍යාපෘති ඉංජිනේරු (කොන්ත්‍රාත් කළමනාකරණ) | 01 | කොන්ත්‍රාත් | |
| 03 | PS 5 | සන්නිවේදන නිලධාරී | 01 | කොන්ත්‍රාත් | |
| 04 | PS 5 | ප්‍රසම්පාදන නිලධාරී | 01 | කොන්ත්‍රාත් | |
| 05 | PS 6 | ව්‍යාපෘති ලේකම් | 01 | කොන්ත්‍රාත් | |

අවශ්‍ය වැඩිදුර තොරතුරු හා විස්තර සඳහා **www.irrigationmin.gov.lk** වෙත ප්‍රවිෂ්ඨ විය යුතු අතර, ඉහත සඳහන් චක්‍රලේඛය සඳහා මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවිය වෙත යොමුවන්න.
අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2023 දෙසැම්බර් 28 දිනට පෙර ලැබෙනසේ එවිය යුතු අතර, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය,**
**(CResMPA),**
**අංක. 11, ජාවත්ත පාර, කොළඹ 05.**

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, 1,3 හා 5 තනතුරු සඳහා තෝරාගැනීමට අදාළ ලිඛිත විභාගයක් පැවැත්වෙනු ඇත. මේ සම්බන්ධව බලපෑම් සිදුකිරීම නුසුදුසු බවට හේතුවනු ඇති අතර, එවන් අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය,**
**දිනය - 2023.12.12**